**2019 අගෝස්තු මස 26 වන දින සිට 31 වන දින දක්වා**

**ප්‍රශංසා එකතු සුපුවත**

**"අපේ පිහිටත් පලිහත් සමිඳාණෝමය."**

01. ආරම්භක ප්‍රශංසාව:
 පුබුදු ගී අංක 38 "සුදත් සුරිඳුනේ ...."

02. ප්‍රශංසාවට හැඳින්වීම: ගීතාවලිය 18 : 2
 "සමිඳාණෝ මාගේ පර්වතය ය; බලකොටුව ය; මිදුම්කාරයාණෝ ය. ඔබ මා දෙවිඳාණෝ ය, පර්වතය ය. මම ඔබ සරණ කොට ගතිමි. ඔබ මට පලිහ ය; ගැළවීමේ බලය ය; උස් කොටු පවුර ය."
 සකල විශ්වය මවා පාලනය කරන දෙවි මහෝත්තමයාණන් වහන්සේට අබ්බා තාත්තේ! අබ්බා අම්මේ! කියන්නට භාග්‍ය ලැබූ ඔබත් මමත්, ඔබේ - මගේ ජීවිත තුළ, අපගේ පිහිටත්, පලිහත්, සරණත් වන දෙවි මහෝත්තමයාණන් වහන්සේව අත්දකින්නේද? අපේ දුකේදී, වේදනාවේදී, අසරණකමේදී අපව මුදවන්නට හැකි, ගළවන්නට හැකි අපේ ශක්තිය, අපේ බලය, අපේ මිදුම්කරුවාණෝ අබ්බා තාත්තාය; අබ්බා අම්මාය. අපි ඔවුන් වහන්සේට ස්තුතියි කියමු. ප්‍රශංසා කරමු.
 පුබුදු ගී අංක 247 - "පලිහකි දිරි දෙන....."

03. දවසේ සුපුවත: රෝම 8 : 1-2
 **"මෙසේ ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වන්නවුනට විරුද්ධව නඩු තීන්දුවක් නැත. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ වූ ජීවනදායක ආත්මයාණන්ගේ ආධ්‍යාත්මික ප්‍රතිපත්ති, පාපයේ හා මරණයේ නියමයෙන් ඔබ නිදහස කර ඇත."**

* මෙම ශුද්ධ ලියවිලි පාඨය නැවතත් තනිවම කියවන්න.

* ශු. පාවුලු තුමන් රෝම සංඝයට ලියන ලද ලිපියෙහි සඳහන් මේ මහා සුබාරංචියට සවන් දීමේදී ඔබට දැනුණු හැඟීම, අත්දැකීම කුමක්ද? ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

* අපි අපගේ අවධානය යොමු කළොත් පළමුවන පදයට -
 පාපය මිනිසාව පරාජිතයෙක්, දුර්වලයෙක් කරත්දී දෙවියන් වහන්සේ මිනිසාට ජයගත නොහැකි තත්ත්වය තම පුතණුවන්ගේ ජීවිතය පූජා කිරීමෙන් පරාජය කළ සේක. ක්‍රිස්තුන් වහන්සේ මිනිසත් බව ගෙන ශුද්ධාත්මයාණන් වහන්සේ තම ගුරුවරයාණන් කර ගෙන ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීමට නතු වෙමින් ජීවත් වූ සේක. ශුද්ධාත්මයාණන් වහන්සේට නිරන්තරයෙන් සවන් දෙමින්, කීකරු වෙමින් පාපයේ හා මරණයේ නියමයෙන් පරාජය වී සිටි මිනිසාව ඉන් ගලවා ගැනීමට සටන් කළ සේක. ශුද්ධාත්මයාණන්ගෙන් (දේව ප්‍රේමයෙන්) පිරෙමින් මුළු ජීවිත කාලයම ගත කළ ජේසු සමිඳාණන් තම දරුණුතම දුක් වේදනා කාල පරිච්ඡේදය (දුක්ප්‍රාප්තිය) පුරාම පාපයට යට නොවී ශුද්ධාත්මයාණන්ට ඉඩ දෙන ජීවිතයක ප්‍රතිඵලය වූ මරණය පරාජය කර උත්ථාන අත්කර ගත් සේක. එතනින් නොනැවතී ඔවුන් වහන්සේව ජයග්‍රහණය කරා මෙහෙයවූ ශුද්ධාත්මයාණන් වහන්සේව අපට තෑගි කළ සේක. එම ශුද්ධාත්මයාණන් තුළ අප ජීවත් වන ප්‍රමාණයට පාපය හා මරණයේ නියමයන් පරාජය කරමින් ජයග්‍රහණය කරා යෑමට අපටද දොරටු විවර කර දුන් සේක.

04. අප දෙසට:
 * එදා රෝම සංඝයට ශු. පාවුලු තුමා ප්‍රකාශ කළ මේ මහා සුභාරංචිය අද දවසේ ඔබටත් - මටත් සුභාරංචියකි; එමෙන්ම අභියෝගයකි.
 * ඔබේත් - මගේත් දුර්වලකම්, අඩුපාඩුකම් තුළ පාපයට වැටෙන ඔබ - මා වෙනුවෙන් ඔවුන් වහන්සේගේ සාධාරණත්වය ඉටුවන්නට නම් අපත් ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වන්නවුන් විය යුතුය.
 * අපේ ජීවිත පැවැත්ම, ජීවිත ප්‍රතිචාරය, අපගේ හැසිරීමේදි ශුද්ධාත්මයාණන්ට අවදි වෙමින් ශුද්ධාත්මයාණන් තුළ ජීවත් වන ප්‍රමාණයන්ට අපටද ජයග්‍රහණ්ය කරා ගමන් කළ හැකිය. අපි අපටම අවදි වෙමින් ඔවුන් වහන්සේ වෙත හැරෙමු. මනස්ස්ථාපනය වෙමු.

05. අවසාන ප්‍රශංසාව:
 ක්‍රිස්තුන් වහන්සේ මෙන් ශුද්ධාත්මයාණන් තුළ ජීවත් වීමේ බලය අපටද ලැබෙන ලෙස අයදිමින් ළඟ සිටින කෙනෙකු ස්පර්ශ කරමින් යාච්ඤා කරමු.
 පුබුදු ගී අංක 365 - සුදත් බලයෙන් පිරෙමු දැන් ....